# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2258/6 – 2021 දෙසැම්බර් මස 13 වැනි සඳුදා – 2021.12.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1076, දඹගිරිගම බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දඹගිරිගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KU/NRM/2019/128 හා 2019.08.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට (01) මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – කොවුල්වැව ගොවිපල – ප්‍රමාණය: **හෙක්. 2.0234 ක් පමණ**

උතුරට: ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හිමිකම් කියන කොවුල් වැව ගොවිපල; නැගෙනහිරට සහ දකුණට: ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හිමිකම් කියන කොවුල් වැව ගොවිපල සහ අස්සැද්දුමේ කුඹුර; බටහිරට: ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හිමිකම් කියන කොවුල් වැව ගොවිපල.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2018/A/484.
2021 අගෝස්තු මස 06 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 12-0125